
3.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයට අදාළව රු.11,000 ක ඉන්ධන වියදමක් 2025 වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණු අතර එම මුදල බැරකම් ප්‍රකාශය තුල ඇතුළත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් ප්‍රකාශනය සහ එස් ඒ -92 භාණ්ඩාගාර මුද්‍රිත ආකෘතිය අනුව ශේෂයන්වල රු.1,009,850 ක වෙනසක් නිරීක්ෂණය විය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
		රු.	
(අ)	1907 අංක 16 දරණ වන සංරක්ෂණ ආඥා පනතේ 64(2)(ඊ) වගන්තිය ප්‍රකාරව (451 වන අධිකාරිය) අනුව විෂයය භාර අමාත්‍යාවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග අංක 2216/34 හා 2021 පෙබරවාරි මස 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය	20,075,375	මාතලේ දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල පිහිටි කලුගල් කැනීම් වැඩබිම්වලින් 2023 වර්ෂය හා 2024 වර්ෂය සඳහා අයකරගතයුතු කැලෑ නිෂ්පාදන ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ආ) 2016 අංක 08 දරන පුද්ගල ලියාපදිංචි කිරීමේ පනතේ 5 වැනි වගන්තියෙන් සංශෝධිත 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 2 වන වගන්තිය - 2024 දෙසැම්බර් 31 දිනට මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක ග්‍රාම නිලධාරි වසම් 195 ක වයස අවුරුදු 15 පසුවූ පුද්ගලයින් 1139 කට ජාතික හැඳුනුම්පත් නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 104(1)(අ) ඡේදය - යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයක් 2024 ජූලි 10 දින අනතුරට පත්ව තිබුණද, පරීක්ෂණ මණ්ඩලය පත්කර ඇත්තේ 2024 ඔක්තෝබර් 16 දින දීය.

(ii) මුදල් රෙගුලාසි 104(4) - අලාභය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද රත්නොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයක් 2024 අප්‍රේල් 11 දින අනතුරට පත්වීම සම්බන්ධයෙන් 2025 ජනවාරි 31 වන විගණන දින වන විට අනතුර සිදුවී මාස 09කට අධික කාලයක් ගතව ඇතත් අලාභ හානිය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 අවධිමත් ගනුදෙනු

මුදල් රෙගුලාසි 137 (5) ප්‍රකාරව සැපයීම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී ඒවා පරීක්ෂාකොට නිවැරදි ලෙස භාරගත් පසු ගෙවීම් වවුචර් අනුමත කිරීමට කටයුතු කළයුතු වුවද විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පෞද්ගලික ආයතනයකින් මිලදීගත් රැස්වීම් ශාලා පුටු 29ක් සඳහා 2024 දෙසැම්බර් 27 දින රු.365,421 ක් ගෙවීම් කළද විගණන දිනයවූ 2025 මාර්තු 03 දින වන විටත් එම භාණ්ඩ අදාළ සැපයුම්කරුගෙන් විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙන්වා ගෙන නොතිබුණි.

3.4 තැන්පතු

මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක ඉන්ධන දහනය පිළිබඳ අක්‍රමිතාවයක් හේතුවෙන් 2022 දෙසැම්බර් මස 29 දින රියදුරුගෙන් අයකරගන්නා ලද රු.28,290 ක මුදල වර්ෂ 02 කට අධික කාලයක් අදාළ පරීක්ෂණ කඩිනමින් ඉටුනොකිරීම හේතුවෙන් පොදු තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

2020 පෙබරවාරි 20 දිනැති අංක 2020/06 දරන ශ්‍රී ලංකා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ආර්ථික සවිබල ගැන්වීමේ ව්‍යාපෘති සඳහා ජීවනෝපාය වක්‍රීය ණය වැඩසටහන් මඟින් සහන ණය ලබාදීමේ නව සංශෝධන ක්‍රියාත්මක කිරීම පිළිබඳ චක්‍රලේඛය අනුව රත්තොට හා විල්ගමුව සමෘද්ධි ප්‍රජා මූල බැංකු 06 ක ණය ලාභීන් 27 දෙනෙකුගෙන් රු.384,389 ක හිඟ ණය මුදලක් මාස 01 සිට මාස 05 දක්වා කාලයක සිට අයනොවී පැවතුණි.

4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

කාන්තා හා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත විදේශගත වන කාන්තාවන් වෙනුවෙන් විකල්ප ආදායම් උත්පාදන මාර්ග, ව්‍යාපෘති වැඩසටහන යටතේ බහිර් කර්මාන්තයට අදාළව ප්‍රතිලාභියෙකු සඳහා රු.25,000 ක් වියදමක් දරා උපකරණ ලබාදී තිබුණද එම ප්‍රතිලාභියා සතුව විදේශ ගමන් බලපත්‍රයක් හෝ සහස් කර නොතිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභියා තෝරාගත් නිර්ණායක තහවුරු වී නොතිබුණි.

4.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

2007 වර්ෂයේ ජාතික සවිය සංවර්ධන වැඩසටහන යටතේ යෝජනා වූ හා 2007 සැප්තැම්බර් 17 දින අනුමත කර තිබූ බත්ගම්පල සහල් සැකසීමේ ව්‍යාපෘතිය විගණන දින වූ 2025 මාර්තු 03 දින වන විටත් වර්ෂ 18 කට අධික කාලයක් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

4.2 ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ඇ) වගන්තිය අනුව ලියාපදිංචි සැපයුම්කරුවන් ප්‍රමාණවත්ව සිටියදී ඔවුන්ගෙන් මිල කැඳවීම් ලබා නොගෙන ඒ සඳහා කරුණු දැක්වීමකින් තොරව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලෝක ආහාර වැඩසටහන යටතේ ගෙවතු වගා ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු. 9,149,175 ක් ද , මාතලේ බර්නාඩ් අළුවිහාරේ කායවර්ධන මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.14,158,466 ක්ද වැය කර තිබූ අතර, මිලදී ගෙන තිබූ කායවර්ධන උපකරණ තාක්ෂණික පිරිවිතරවලටද අනුකූලවී නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 5 ක් වසර 02කට අධික කාලයක සිට නිෂ්කාර්යයව පැවතුණි.

(ආ) අඔන්හඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක් ඌන උපයෝජිතව පැවතුණ අතර ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අයත් බදු ලබා දී තිබුණු ගොඩනැගිල්ලකින් 2015 වර්ෂයේ සිට බදු කුලී අයකර නොතිබුණි.

4.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 881 (1) සහ 2019 මාර්තු 23 අප්‍රේල් 09 දිනැති අංක 07/2019 දරන අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ රාජ්‍ය නිලධාරීන්ගේ ඇප අය කිරීම පිළිබඳ චක්‍රලේඛයේ 05 වන ඡේදය අනුව රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.11,500 ක ඇප තැන්පත් මුදල් ලබා ගෙන නොතිබුණි.

4.5 පාඩු හා හානි

1987 රජයට ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනතෙහි 361 වගන්තියෙහි 4 ඡේදය අනුව 38 (අ) අතුරු විධානය පලකර වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් මාර්ග සංවර්ධනය සඳහා අත්පත් කරගත් මාතලේ හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල පිහිටි ඉඩම් කැබලි 40 ක් වෙනුවෙන් රු. 39,163,641 ක පොලී මුදලක් ගෙවා නිබුණි.

4.6 අවධිමත් ගනුදෙනු

(අ) 2024 අප්‍රේල් 04 දිනැති මුදල්, ආර්ථික ස්ථායිකරණ සහා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ DFD/2024-1 දරන චක්‍රලේඛයේ 2.3.2 ඡේදයේ සඳහන් පරිදි ගිවිසුම්ගත සහල් මිලදී ගැනීම සඳහා සහල් මෝල් හිමියන් සමඟ සෘජුවම සම්බන්ධ නොවී තෙවන පාර්ශවයන් හරහා සහල් මිලදී ගෙන , තෙවන පාර්ශවයන් වෙත සහල් සඳහා රු.281,901,227 ක් ද ප්‍රවාහන වියදම් ලෙස රු.6,623,772 ක් ද වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.288,524,999 ක් ගෙවා නිබුණු අතර භාණ්ඩ සැපයීමට පෙර ගිවිසුම්ගතවීමක්ද සිදුකර නොනිබුණි.

(ආ) සහල් කි.ග්‍රෑම් 503,260 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.94,581,030 ක් හා රු.2,435,981 ක් ප්‍රවාහන ගාස්තු ගෙවීම සඳහා බිල්පත් ඉදිරිපත්කර තිබූ සහල් මෝලක් අක්කරෙපත්තුවෙහි එම ලිපිනයෙහි නොමැති බව ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි මෙන්ම අක්කරෙපත්තු මෝල් හිමියන්ගේ සංගමයේ ලේකම්වරයාද සනාථ කර තිබීම අනුව ගෙවීම් කිරීමේ විනිවිදභාවය පිළිබඳ විගණනයේදී සැඟීමකට පත්විය නොහැකි වූ අතර තිස්සමහාරාම සහල් මෝලයකින් සහල් කිලෝ ග්‍රෑම් 117010 ක් සැපයුම් කළ බවට රු. 21,763,860 ක් හා ප්‍රවාහන වියදම් ලෙස රු.521,973 ක් ගෙවීම් කර නිබුණද අදාළ සහල් මෝල් හිමිකරුගේ ප්‍රකාශ අනුව ඔහු විසින් සපයා ඇත්තේ සහල් 30,000 Kg පමණක් හා ප්‍රවාහන වියදම රු.120,000 ඔහු අතින් දරා එම සහල් ප්‍රවාහනය කර දී ඇති බැවින් රු.521,973 ක සාවද්‍ය ප්‍රවාහන වියදමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සිදු කර නිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 128(1) (ඒ) අනුව රජයේ කටයුතු ඉටුකිරීමේදී අපේක්ෂිත අරපිරිමැසීම, කාර්යක්ෂමතාවය, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳව නිසි සැලකිල්ලකින් යුත්කව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යනු ලබන බවට විශේෂයෙන් වියදම් කරනු ලබන මුදල සඳහා උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරීම ගණන්දීමේ නිලධාරියකු ලෙස දිස්ත්‍රික් ලේකම්වරයාගේ වගකීම වුවද සහල් කි.ග්‍රෑම් එකක් සඳහා ආසන්න වශයෙන් රු. 10 ක් ලෙස රු. 15,076,800 ක අනීතික ලාභයක් උපයා ගැනීමට බාහිර පාර්ශවයකට ඉඩ සලසා තිබූ බවත්, මාතලේ දිස්ත්‍රික්කයට ආසන්න ප්‍රදේශවලින් සහල් සපයා ගැනීමට කටයුතු නොකිරීම මඟින් රු. 1,743,000 කට ආසන්න ප්‍රවාහන වියදමක් වැඩිපුර දැරීම සඳහා රජයේ අරමුදල් භාවිතා කිරීම මඟින් රජයට අලාභයක් සිදු කර තිබුණි.

4.7 කළමනාකරණ දුර්වලතා

(අ) 2013 ජූලි 05 දිනැති අංක HAF-3-ADMIN -02-002 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයේ 07 වන වගන්තිය අනුව රජය සතු ඉඩම්වල අනවසරකරුවන් ඉවත් කිරීමට රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීමේ) පනත යටතේ කටයුතු කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් කළ යුතු බවට දක්වා තිබුණද ගලේවෙල, විල්ගමුව , රත්තොට, අඹන්හග කොරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වාර්තා වී තිබූ අතර රජය් ඉඩම් වල අනවසර පදිංචිකරුවන් 13 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඇ) විල්ගමුව ,මාතලේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල විශ්‍රාම වැටුප් ලාභීන් 17 දෙනෙකු සඳහා මුදලක් වැඩිපුර ගෙවා තිබුණු රු.4,140,182 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් අයකර ගැනීමට පැවතුණි.

(ඉ) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතුව සිට 2023 වර්ෂයේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම සිදුකර තිබූ සේවකයෙකු ගේ හිඟ ණය ශේෂය වන රු. 125,322 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර රජයේ අමාත්‍යාංශවලට /දෙපාර්තමේන්තුවලට ස්ථානමාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය වන රු.708,873ක ශේෂය හා ලැබීමට ඇති ණය අත්තිකාරම් යටතේ වූ රු.39,593 ණය ශේෂය වර්ෂ 1-3 අතර කාලයක් ගතවී තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතුව සිට සේවය අතහැර ගොස් ඇති සේවකයකුගේ ආපදා ණය ශේෂය වූ රු.59,465 ක මුදල අයකර ගැනීමට අදාළව ඔහු විසින් මාසික වාරික බැගින් රජයේ ගිණුමට මුදල් තැන්පත් කිරීමට එකඟ වී තිබියදී , එම නිලධාරියා 2001 සැප්තැම්බර් 28 වන දින සිට අතුරුදන්ව සේවයට වාර්තාකොට නොමැතිබව දන්වමින් එම ණය ශේෂය පොත්වලින් කපාහැරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පැවතුණි.

5 යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

(අ) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පිහිටි කළුගල් කැනීමේ කර්මාන්තයක් සඳහා අවස්ථා ගණනාවකදී මහජන විරෝධතා දක්වා තිබුණද ගල් පිපිරවීම්/කැණීම් කාර්යයන් සඳහා පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා වූ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ 2023 දෙසැම්බර් 18 දිනැති අංක 01/2024 චක්‍රලේඛයේ 1 "අ" ආකෘතිය මඟින් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ජීවත්වන නේවාසිකයින් ගල් බෝර දැමීම පිළිබඳ විරුද්ධත්වයක් නොමැති බවට සහතිකයක් කළුගල් කර්මාන්තකරුවන් දෙදෙනෙකුට නිකුත් කර තිබුණි.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ 2020 මැයි 15 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයේ 4 (iv) ඡේදය ප්‍රකාරව දේපල හානි සඳහා මුදල් ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක 2024 වර්ෂයේ තත්සේරු කරන ලද ප්‍රතිලාභීන් 208 ක් සඳහා වූ රු.2,768,760 ක වන්දි මුදලක්, ලබාදීමට කටයුතු කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

(අ) නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා භාෂා පරිවර්තක තනතුරක් (සිංහල - ඉංග්‍රීසි) අනුමත වී නොතිබියදී භාෂා පරිවර්තක නිලධාරියකු සේවයේ යොදවාගෙන වැටුප් ගෙවීම් කර තිබුණි.

(ආ) 2021 අගෝස්තු 06 දිනැති අංක 01/2021 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයේ සඳහන් ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2.2 ඡේදය ප්‍රකාරව එකම සේවා ස්ථානයක් තුළ වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා ස්ථාන මාරු වීම් ලබා දිය යුතු වුවද රත්තොට, අඹන්හග කෝරළේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන් 66 දෙනෙකු එකම සේවා ස්ථානයේ වසර 05 ත් වසර 12 ත් අතර කාලයක් සේවය කරමින් සිටියද ඔවුන් වෙත ස්ථාන මාරුවීම් ලබාදී නොතිබුණි.

එම්.කේ.ඩී.එන්. මායාකඩුව
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. කාර්ය සාධන දර්ශක

4.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් තත්‍ය නිමැවුම (%) ලෙස		
	100%	**75%-99%**	**50%-74**
ආදායම් උත්පාදන සමූහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	226%		
අඩු ආදායම්ලාභී පවුල්වල අධ්‍යාපනයට දක්ෂ දරුවන් සඳහා කැපකරු දෙගුරු දායකත්වය ලබා දීම	182%		
පාසල් හැර යන දරුවන් වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම රැකියා ගත කිරීම	113%		
ස්වයං රැකියා වලට යොමුවීමට අපෙක්ෂිත ප්‍රතිලාභීන් ස්වයං රැකියාගත කිරීම සහ ව්‍යාපාර ලියාපදිංචිය සඳහා යොමු කිරීම	186%		
ජල පෝෂක ප්‍රදේශයක් සංරක්ෂණය කර වන ගහණය වර්ධනය කිරීම.			33%
රජයේ ආදායම ඉහල නැංවීම සඳහා රජයේ හදුනාගත් ඉඩම් කොටස් සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබාදීම.			51%

05. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු

තිරසාර සංවර්ධන අරමුණු	ඉලක්කය	KPI	ප්‍රගතිය
01. සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	• ආර්ථික වශයෙන් සවිබලගැන්විය යුතු පවුල්/පුද්ගලයින් හඳුනාගෙන සවිබලගැන්වීම • ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික මට්ටම ඉහල නැංවීම	➢ සමෘද්ධි, අස්වැසුම,චකුගඩු, ආබාධිත,වැඩිහිටි ආදී ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව ➢ ලෝක ආහාර වැඩසටහන යටතේ සවිබල ගන්වන ලද පවුල් ගණන ➢ නහා සිටුවූ විවිධ ක්ෂේත්‍රයන්ගේ ව්‍යවසායකයින් / පවුල් ගණන ➢ රැකියා ගත කල පුද්ගලයින් ගණන ➢ නව නිවාස ලද පවුල් ගණන	**93%**
02. සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	• තිරසාර කෘෂිකර්මාන්තය තුළින් ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම • දිස්ත්‍රික්කයේ කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීම හා පසු අස්වනු හානි අවම කිරීම	➢ ලබා දුන් රෝපන ද්‍රව්‍ය ප්‍රමාණය ➢ ලබා දුන් කෘෂි යන්ත්‍රෝපකරණ ගණන ➢ පැවැත්වූ කෘෂිකාර්මික පුහුණු වැඩසටහන් ගණන	**103.70%**

		➢ ස්ථාපිත කළ ගෙවතු/ සත්ත්ව ගොවිපළවල් සංඛ්‍යාව ➢ බෙදා දුන් වායු රයිෆල් ගණන ➢ ලබා දුන් කෘෂි යෙදවුම් ගණන ➢ ලබා දුන් වගා හා පොහොර සහනාධාර ප්‍රමාණය	
03. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	• සෑමට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ලබාදීම	➢ අවසන් කරන ලද වකුගඩු රෝග නිවාරණ ඒකකය ➢ පැවැත්වූ ළඳරු සහ මාතෘ සායන සංඛ්‍යාව ➢ ගර්භනී මව්වරුන්ට ලබා දෙන පෝෂණ වවුවර්පත් සංඛ්‍යාව ➢ සිදුකරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණ ප්‍රමාණය ➢ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය ➢ උපදේශනයන් හා වැඩසටහන් සඳහා යොමු වන සේවාලාභීන් ප්‍රමාණය	**94%**
04. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සෑමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	• දරුවන් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම	➢ ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව(අධ්‍යාපන ආධාර ලබාදීම වැනි) ➢ අඩු ආදායම්ලාභී පාසල් දරුවන් සඳහා ලබා දුන් ශිෂ්‍යත්ව සංඛ්‍යාව (සමෘද්ධි සහ ජනාධිපති ශිෂ්‍යත්ව) ➢ ළමුන් සඳහා පවත්වනු ලබන වැඩසටහන් සඳහා යොමු වන දරුවන් ප්‍රමාණය ➢ දරුවන්ගේ විභාග ප්‍රතිඵල / දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කාර්ය සාධන මට්ටම	**116.54%**
05. ස්ත්‍රී, පුරුෂ සාමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	• කාන්තාවන් හා දැරියන් සවිබල ගැන්වීම	➢ පවත්වන ලද වැඩසටහන් ගණන (ස්ත්‍රී, පුරුෂ සාමානාත්මතාවය පිළිබඳ) ➢ දැනුවත් කරන ලද නිලධාරීන් ගණන ➢ සවිබල ගැන්වූ කාන්තාවන් හා දැරියන් ප්‍රමාණය ➢ ව්‍යවසායකත්වයට යොමු කරන ලද කාන්තාවන් සංඛ්‍යාව	**152%**
06. සෑමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම	• සෑමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම	➢ සනීපාරක්ෂක/ ජල පහසුකම් ලබා දුන් ප්‍රතිලාභීන් ගණන ➢ ජලයෙන් බෝවන රෝග වල අඩුවීම ප්‍රතිශතය ➢ පානීය ජලය ලබා දුන් වකුගඩු රෝගයට පාත්‍ර වූ පවුල් / ප්‍රදේශ ගණන ➢ පානීය ජල ව්‍යාපෘතිය සඳහා වැය කළ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය	**97%**
07. සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම.	• මාතලේ දිස්ත්‍රික්කයේ සියල්ලන් සඳහා විදුලිය	➢ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කල විදුලි ව්‍යාපෘති සංඛ්‍යාව/ විදුලිය ලබා දුන් පවුල් සංඛ්‍යාව ➢ ස්ථාපිත කල සුර්ය පැනල සංඛ්‍යාව ➢ විදුලිය සඳහා අවම වූ පිරිවැය ප්‍රතිශතය ➢ සුර්ය පැනල සවි කිරීමට වැය කල ප්‍රතිපාදන ප්‍රමාණය	**98.50%**
08. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	• ව්‍යවසායකයින්ගේ අලෙවි ප්‍රවර්ධනය • විරැකියාවෙන් පෙළෙන ප්‍රජාව රැකියාගත කිරීම	➢ ආරම්භ කරන ලද නව ව්‍යාපාර ගණන ➢ සංවර්ධනය කරන ලද ව්‍යාපාර ගණන ➢ නගා සිටුවන ලද කර්මාන්ත කරුවන් ගණන හා අලෙවිකරුවන් ගණන	**94%**

		➢ පවත්වන ලද රැකියා පොළ සංඛ්‍යාව ➢ ව්‍යක්තීය පුහුණුවට යොමු කරන ලද තරුණ තරුණියන් සංඛ්‍යාව	
09. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	• තිරසර සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය	➢ අවසන් කරන ලද යටිතල සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණය ➢ සංවර්ධනය කරන ලද යටිතල පහසුකම් වල මූල්‍ය හා භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය ➢ සංවර්ධනය වූ ක්ෂේත්‍ර ගණන ➢ යටිතල පහසුකම් ලබා දුන් සමිති ගණන	**141.83%**
10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම	**අදාල නොවේ**		
11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	• සියළු ජනතාවට පරිපූර්ණ, ආරක්ෂිත ජන සමාජයක් ඇති කිරීම	➢ නිරවුල් කරන ලද ආරවුල් ප්‍රමාණය ➢ පිළිතුරු ලබා දුන් මහජන පැමිණිලි සංඛ්‍යාව	**70.66%**
12. තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම	• දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය ඉහළ නැංවීම හා පරිභෝජනය සහතික කිරීම	➢ දිස්ත්‍රික්කයේ අදාළ ක්ෂේත්‍ර වල නිෂ්පාදනය ඉහළ නැංවූ ප්‍රතිශතය ➢ ආහාර සුරක්ෂිතතාව ඇතිවූ පවුල් සංඛ්‍යාව ➢ පෝෂණය සහතික කරන ලද පාසල් සහ පාසල් දරුවන් ගණන	**99.50%**
13. දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම	• කාලගුණික වෙනස්වීම් අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම හා පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම	➢ ආපදා සහන ලබා දුන් ප්‍රතිලාභී පවුල් ගණන ➢ පවත්වන ලද ආපදා කළමනාකරණ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය	 **100%**
14. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායක භාවිතය	**අදාල නොවේ**		
15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම	• දිස්ත්‍රික්කයේ පාරිසරික හා ජෛව විවිධත්ව සංරක්ෂණය සහතික කිරීම	➢ විසඳන ලද පරිසර ගැටළු ප්‍රමාණය ➢ පවත්වන ලද පරිසර කමිටු ගණන ➢ විසඳුම් ලබා දුන් ජල මූලාශ්‍ර සම්බන්ධ ගැටළු ප්‍රමාණය ➢ පාලනය කරන ලද කැළෑ ගිනිතැබීම් ප්‍රමාණය ➢ පවත්වන ලද රුක් රෝපණ වැඩසටහන් ගණන ➢ සකස් කරන ලද ඉඩම් පරිහරණ සැලසුම් ගණන	**91.75%**
16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සෑමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම	• ප්‍රජා/ නිලධාරි ධාරිතා සංවර්ධනය	➢ බල ගන්වන ලද ප්‍රජා සංවිධාන ගණන ➢ ධාරිතා සංවර්ධනය පිළිබඳ පවත්වන ලද වැඩසටහන් ගණන ➢ ධාරිතා සංවර්ධනය කරන ලද නිලධාරින් / ආයතන සංඛ්‍යාව	**79.54%**
17. ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගිතාවයේ පුනර්ජීවනය	• සැලසුම් සකස් කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකය සවිමත් කිරීම	➢ නගා සිටුවන ලද ව්‍යවසායකයින් සංඛ්‍යාව ➢ සාර්ථකව ක්‍රියාවට නැංවූ සැලසුම් ගණන ➢ හඳුනා ගන්නා ලද ජීවනෝපාය ව්‍යාපෘති ගණන ➢ හඳුනා ගන්නා ලද නිෂ්පාදන ගම්මාන ගණන	**124.50%**

5.2 තිරසර සංවර්ධන අරමුණු ජයග්‍රහණය සහ අභියෝගය

තිරසර සංවර්ධන අරමුණු	ජයග්‍රහණය	අභියෝග
1. සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	• ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් 16 ක් ක්‍රියාත්මක වූ ඒ සඳහා රු. මි. 62 කට ආසන්න පිරිවැයක් දැරීම. ඒ තුලින් දුගී බව නිමා කිරීම සඳහා තව දුරටත් සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල, සමෘද්ධි සහනාධාර වැඩපිළිවෙල, අඩු ආදායම් ලාභීන් ඉලක්ක කරගන්නා ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක වේ. • නිවාස නොමැති ප්‍රතිලාභීන් සඳහා නිවාස ලබා දීම • පිටකන්ද,කාච්චමලේ සහ හුණුගල වතු නිවාස 390ක් සෙවිලි කිරීම	• කොට්ඨාශයේ අඩු ආදායම් ලාභීන් සංඛ්‍යාව ඉහල අගයක් ගැනීම • දේශගුණ විපර්යාස මත සිදුවන ස්වභාවික ආපදා හේතුවෙන් සිදුවන සෘජු කෘෂි නිෂ්පාදන හා ආර්ථික හානි • උද්ධමනය ඉහළ අගයක් ගැනීම • භාණ්ඩ හා සේවා වල මිල ගණන් ඉහල අගයක් ගැනීම බැංකු පොලී අනුපාතයන් ඉහළ අගයක් ගැනීම • මුදලේ ශක්තිය අඩු වීම • රුපියල අවප්‍රමාණය වීම • තරුණ විරැකියාව • ඉටුකරන රාජකාරියට ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවීම
2. සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනයකිරීම	• මාතලේ දිස්ත්‍රික්කය තුළ මන්දපෝෂණ මට්ටම සෘණ අගයක් ගන්නා අතර, මරණ අනුපාතය පහළ මට්ටමක පවතී. ඒ තුළින් නිරූපණය වන්නේ නිරෝගීමත් ජනගහනයක් සිටින බවයි. මුළු රැකියා නියුක්තියෙන් 24.6% ක් කෘෂිකාර්මික අංශයේද, 21.6%ක් කර්මාන්ත අංශයෙන්ද, 53.8%ක් සේවා අංශයෙන්ද නියුක්තව සිටියි. සේවා වියුක්ති අනුපාතය ක්‍රම ක්‍රමයෙන් අඩු අගයක් කරා ගමන් කරයි. • ආහාර ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන සඳහා ව්‍යාපෘති වැඩිදියුණු කිරීම් කටයුතු කිරීම • පුහුණු වැඩසටහන් පැවැත්වීම	• ඵලදායි හා තිරසාර කෘෂිකාර්මික භූමි ප්‍රමාණය සීමා සහිත වීම. • සීඝ්‍රයෙන් වෙනස්වන ජනගහන අනුපාතය • බෝ නොවන රෝගීන් සංඛ්‍යාව වැඩි වීම (දියවැඩියාව, කොලොස්ට්‍රොල්) • ආහාර මිල අසමානතා දර්ශකයන්ඉහල අගයක් ගැනීම • කෘෂි අපනයන සහනාධාර ඉතා ඉහල අගයක් ගැනීම • රාජ්‍ය වියදම වන කෘෂිකාර්මික දිශානුගත දර්ශකය ඉහල අගයක් ගැනීම • නිෂ්පාදන අමුද්‍රව්‍ය මිල ඉහල යාම • කෘමී / වන සත්ත්ව උවදුරු පැමිණීම • කාළගුණික විපර්යාස නිසා හටගන්නා ආපදා තත්වයන් • ඇතැම් ජන කණ්ඩායම්වල යැපුම් මානසික තත්වය හා සෘණ ආකල්ප

3. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	• විධිමත් ලෙස සකස් කළ ගෘහ ඒකකයන් හා හිසට සෙවනක් නැති ප්‍රතිලාභීන් උදෙසා ඉදිකරන ලද නිවාස, වකුගඩු රෝගීන් සඳහා නිවාස, මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ක්‍රියාත්මක වූ වැඩසටහන් සහ මාසිකව ලබා දුන් උපකරණ හා පැවැත්වූ සායන යනාදිය	• සහනාධාර ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම • වකුගඩු රෝගීන් සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වැඩි වීම • මත් ද්‍රව්‍යට අබ්බැහි වූ පුද්ගලයන් සංඛ්‍යාව ඉහල අගයක් ගැනීම • මූලික අවශ්‍යතාවයක් වන (නිවාස) නොමැති පවුල් සංඛ්‍යාව ඉහල අගයක් ගැනීම • සනීපාරක්ෂක පහසුකම් නැති වතු නිවාස ඉහල සංඛ්‍යාවක් පැවතීම • වකුගඩු රෝග බහුල ප්‍රදේශවල අයට පානීය ජල පහසුකම් ලබා දීමේදී ඇතිවන ගැටළු
4. පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	• පාසල් ළමුන් සඳහා පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන සඳහා රු.මි 42ක පිරිවැයක් දැරීම(ජාතික පාසල් පෝෂණ වැඩසටහන - ලෝක ආහාර වැඩසටහනේ දායකත්වය) • පාසැල් හැර ගිය සිසු දරුවන් සඳහා අපොස සා.පෙ. හා අපොස උ.පෙල. සුදුසුකම් ලත් දරුවන් සඳහා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර ඔවුන්ගේ අභිමතාර්ථයක් ලෙස වෘත්තියක් සඳහා ශ්‍රම වෙළඳපලක් පිහිටු වීම. • සමෘද්ධි සිප් දොර වැඩසටහන	• අපොස සා.පෙල හා උ.පෙල සමත් දරුවන්ගෙන් වැඩි පිරිසක් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා අහිමි වීම • ඵලදායිතා සම්මාන තරඟාවලියේ නිර්ණායකයන් සපුරා ගැනීමේ ඇති ගැටළු • සාක්ෂර අනුපාතය ඉහල අගයක් ගන්නා නිසා ශ්‍රම වෙළඳපොලේ ඇති තරඟකාරිත්ව පසුබිම • පාසල් හැරයන්නන් වෘත්තීය අධ්‍යාපන සඳහා යොමුවන ප්‍රමාණය අවම වීම • පාසල් දරුවන් හා තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති වීම
5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	• ළමා ආරක්ෂාව පිළිබඳව වතු ප්‍රජාව සවිබලගැන්වීම හා ළමා නිවාසවල කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා සෞඛ්‍ය පහසුකම් වර්ධනය කිරීමත් ගැහැණු දරුවන්ට විධිමත් ආරක්ෂාවක් තවදුරටත් ගොඩනැංවීම කටයුතු සලසා ඇත • අඩු වයස් විවාහ වැළැක්වීම සඳහා ළමා ආරක්ෂණ කමිටු, 1929 පැමිණිලි අංකය තුළින් වැඩසටහන් මාලාවක් මාතලේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම • දේශපාලන අධිකාරිත්වයට පලාත් පාලන මැතිවරණයට අයදුම් කරන පුද්ගලයන් අතරින් කාන්තාවන්ට වැඩි ඉඩක් සලසා තිබීම	• මාතලේ දිස්ත්‍රික්කය තුළ අපචාර ප්‍රමාණය වැඩි වීම • කාන්තාවන්ගේ අධ්‍යාපනික දැනුම් මට්ටම පහත මට්ටමක පැවතීම • දේශපාලන අධිකාරිත්වයට කාන්තා දායකත්වයක් ලබා නොදීම • ලිංගික අධ්‍යාපනය පිළිබඳ දැනුම අඩු මට්ටමක පැවතීම • වතු ආශ්‍රිතව සිටින ගැහැණු දරුවන් / කාන්තාවන් විවිධ වූ අතවරයන්ට ලක්වීම
6. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම	• රු.මි. 12.1 වියදමින් වතු ප්‍රජාවගේ සනීපාරක්ෂක පහසුකම් / ජල පහසුකම් සැපයීම • ඊට අමතරව රසායනික බෙහෙත් වලින් වන හානි අවම කිරීම සඳහා කාබනික බෝග වගාවන් සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාව පෙළඹවීම. ඒ තුලින් ස්වභාවික ජලය ආරක්ෂා කිරීමට වැඩ පියවරක් ලෙස මාතලේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වේ. • වන වගාවන් හා වන රෝපණ වැඩ සටහන් මාතලේ දිස්ත්‍රික්කයේ ඉඩම් අංශය තුලින් මසකට වරක් ක්‍රියාත්මක වන අතර, ඒ තුලින් ජල පෝෂිත ප්‍රදේශයන් ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත. • පානීය ජල ව්‍යාපෘති සඳහා රු.මි. 33.72ක් වැය කිරීම	• පරිභෝජනය කළ හැකි ජලය ප්‍රමාණය සීමා සහිත වීම • බීමට ගන්නා ජලයේ හුණු ද්‍රාවණය ඉහල අගයක් ගැනීම • ජලයට මිනිස් හා සත්ව මලපහ මිශ්‍ර වී තිබීම • ජල පෝෂිත ස්ථාන අඩු අගයක් ගැනීම • දේශගුණික විපර්යාසයන්ට නතු වීම (නියඟය/ ගංවතුර) • භූගත ජලයට විවිධ වූ කෘෂි රසායනික ද්‍රව්‍ය මිශ්‍රවීම
7. සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බල	• මාතලේ දිස්ත්‍රික්කයේ පාරිභෝගිකයන් සඳහා විදුලි සැපයුම 96% කට වඩා වැඩි ප්‍රමාණයකට සපයා තිබීම	• බලශක්ති අපතේ යාම හා හානි වීම • බලශක්ති ක්ෂේත්‍රයට අනුබද්ධ ආයතන වල මානව සම්පතෙහි

ශක්ති සැපයුම සහතික කිරීම	• මොරගහකන්ද ජල ව්‍යාපෘතිය තුලින් මෙ.වො. 25 ධාරිතාවයක් සමස්ත විදුලි ජනනය සඳහා දායක කෙරේ. • රු.මි 11.5ක ව්‍යාපෘති 4ක් යටතේ සූරිය පැනල 162ක් ස්ථාපිත කිරීම • විල්ගමුව කොට්ඨාශයේ වනඅලි තර්ජන සහිත ඉතාමත් දුගී පවුල් 5ක් සඳහා විදුලිය සැපයීම • රජයේ කාර්යාලවල සූර්ය බලශක්ති පැනල සවි කිරීම	කුසලතා සංවර්ධනය ප්‍රමාණවත් නොවීම හා පරීක්ෂණ හා තාක්ෂණ කටයුතු ප්‍රමාණාත්මකව සිදු නොවීම • විදුලි නිෂ්පාදනය සඳහා අධික පිරිවැය • සමස්ත ප්‍රවාහන ක්ෂේත්‍රයම ආනයනික තෙල් මත යැපීම • සියළු සංවර්ධන ක්ෂේත්‍රයන්හි බලශක්ති ඉල්ලුම දිනෙන් දින ඉහලයාම • විදුලි බල ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල ආයෝජනයක් අවශ්‍ය වීම • පවතින සම්ප්‍රදායික ආයතනික රාමුව තුලින් බලශක්ති ක්ෂේත්‍රය අභියෝග සපුරාලීම සඳහා අවශ්‍ය දිරිමත් කිරීම් සිදු නොවීම • තිරසාර නොවන බලශක්ති පරිභෝජන රටාව
8. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වානසීය, තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනයකිරීම	• මාතලේ දිස්ත්‍රික්කය තුළ විවිධාංගීකරණය, තාක්ෂණය ඉහල නැංවීම සහ නවෝත්පාදනය තුලින් ඉහල වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රයන් පිළිබඳව සිදු කරනු ලබන ක්ෂේත්‍ර වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක විය. • ඒ තුලින් ඵලදායී ක්‍රියාකාරකම් වලට සුදුසු රැකියා අවස්ථාවන් හා රැකියා වෙළඳපලවල් ගණනක් ක්‍රියාත්මක විය.	• ඒක පුද්ගලික ආදායම අඩු වීම • දේශීය නිෂ්පාදනයට යොමු වන සේවා නියුක්ති ප්‍රමාණය අඩු වීම • සංක්‍රමණික ප්‍රමාණය වැඩි වීම • තරහකාරීත්වය ඉහල අගයක් ගැනීම • නවෝත්පාදන සඳහා යොමු වීමට ප්‍රාග්ධනය හිහකම
9. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනයකිරීම	• මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තාක්ෂණය හා නව්‍යකරණයට හෙබි නවගොඩනැගිල්ලක් ඉදි කිරීම හා කාර්යාලය මඟින් මහජනයාට ලබා දෙන විවිධ සේවාවන් පරිසණක දත්ත වැඩසටහන් අනුසාරයෙන් සිදු කිරීම • ආයතනික සේවාවන් අන්තර්ජාල පහසුකම් ඔස්සේ මහජන පහසුව පිණිස ක්‍රියාත්මක වේ.	• තාක්ෂණය ඉතා සීඝ්‍රයෙන් වෙනස් වීම • අනවසරයෙන් පරිසණක පද්ධතියට ඇතුලු වීම (හැකර්ස්) • ජංගම දුරකථන හා තාක්ෂණයෙන් ආවරණය වන ජනගහන අනුපාතය ඉහල අගයක් ගැනීම
10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම	• ප්‍රජාතාන්ත්‍රික ජනරජය විසින් ක්‍රියාත්මක වන සර්වජන ඡන්ද බලය මාතලේ දිස්ත්‍රික්කයේ ඡන්දය හිමි සියළුම පුරවැසියන්ට ලබා දී තිබීම	• ඉල්ලුම් කරන දේශපාලන පක්ෂ ගණනාවක් පැවතීම • මහජන නියෝජිතයන් පක්ෂ මාරු කිරීම
11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	• මාතලේ දිස්ත්‍රික්කය තුළ උකුවෙල, රත්තොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ආපදා තත්වය හේතුවෙන් ඇති වූ ආපදා හානි වලට පිළියමක් ලෙස ආපදා සඳහා ගෙවීම, නිවාස ඉදිකිරීම්, යටිතල පහසුකම් දියුණු කිරීම ක්‍රියාවට නැංවීම	• දේශගුණික විපර්යාසයෙන් සිදුවන නිවාස හානි • නගරවල පවත්නා ක්ෂුද්‍ර අංශමය පදාර්ථ වාර්ෂික මධ්‍යනය මට්ටම ඉහල අගයක් ගැනීම
12. තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම	• මාතලේ දිස්ත්‍රික්කය තුල කෘෂිකාර්මික යටිතල භෝග වගාවන් ක්‍රියාත්මක වේ. • අපද්‍රව්‍යය ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. දේශීය කර්මාන්ත හා කලා ගම්මාන ඉහල නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. ඒ තුලින් කලාකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය කටයුතු සලසා තිබීම • තිරසර කුකුල් ගොවිපළ 148ක් ස්ථාපිත කිරීම හා ගෙවතු 162ක් ස්ථාපිත කිරීම	• දෛනිකව එකතු වන කසළ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 30 කට වඩා වැඩි වීම • එළවලු භෝග වගාවන් සඳහා වෙළඳපලේදී සාධාරණ මිලකට අලෙවි කල නොහැකි වීම • එළවලු භෝග වගාවන්හි ඵලදාව විනාශ වන ප්‍රමාණය(පසු අස්වනු හානි) වැඩි වීම • කෘෂිකාර්මික හා සත්ත්ව පාලන යෙදවුම් වල මිල අධික වීම • වන සත්ත්ව හානි

13. දේශගුණික විපර්යාසය සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක කිරීම	• මාතලේ දිස්ත්‍රික්කය තුළ කාළගුණික වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ණ අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහල නැංවෙන වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක විය.	• කාබන් පාද සටහන ඉහල අගයක් ගැනීම • හරිතාගාර වායු විමෝචනය වැඩි වීම • ආහාර නිෂ්පාදනයට තර්ජනයක් වන පරිදි ජාතික ප්‍රතිපත්ති සකස් වී තිබීම • දේශගුණික විපර්යාස නිසා දිස්ත්‍රික්කයේ ආහාර නිෂ්පාදනය අඩු වීම
14. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය	• මාතලේ දිස්ත්‍රික්කය තුළ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සඳහා ලෝක ආහාර වැඩසටහන යටතේ ප්‍රතිපාදන ලබා දී වැඩසටහන් ක්‍රියාත්මක විය. ඒ තුලින් ධීවර ප්‍රජාවන්ගේ ආර්ථික රටාව නඟා සිටුවීම සඳහා කෘෂි, සත්ව ණය අරමුදල් වැඩසටහනක් ක්‍රියාත්මක වේ.	• මිරිදිය මත්ස්‍ය පාලනය සඳහා වන තාක්ෂණික ක්‍රම වල පවතින හිඟ බව • මිරිදය මත්ස්‍ය පාලනය සම්බන්ධව පවතින අනවබෝධය • සංස්කෘතිකමය බලපෑම්
15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනයකිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම	• මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම ජන කොටස් සඳහා ඉඩම් සඳහා නෛතික උරුමය යටතේ ඔප්පු 342ක් ලබා දීමේ වැඩසටහන මේ වන විටත් ක්‍රියාත්මක වේ. • වතු නිවාස සඳහා ස්ථිර ඔප්පු 200කට අධික ප්‍රමාණයක් ලබා දීම	• සමස්ථ භූමි ප්‍රමාණයෙන් හානියට ලක් වී ඇති ප්‍රමාණය ඉහල අගයක් ගැනීම • නීතිවිරෝධී වන ජීවීන් දඩයම් කිරීමේ ප්‍රමාණය ඉහල යාම • කඳුකර හරිත ආවරණ දර්ශකය අඩු මට්ටමක පැවතීම
16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්නසමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැඟීම	• මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම රාජ්‍ය අංශයන්වල කාර්යක්ෂම හා ඵලදායි දිස්ත්‍රික් පරිපාලනය ක්‍රමයක් ඇති කිරීම, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්ගේ සමන්විත සම්බන්ධීකරණ ජාලයක් ඇති කිරීම, සමාජ සුභසාධන හා සංස්කෘතික වැඩසටහන් හරහා සමාජ සංරක්ෂණයක් ඇති කිරීම, ජනතා අවශ්‍යතා මත පදනම් වූ යටිතල පහසුකම් ව්‍යුහයක් ඇති කිරීම හා අල්ලස හා දූෂණයෙන් තොර ඵලදායි වගකීම් යුක්ත විනිවිද භාවයකින් යුතු ආයතන පිහිටුවීම	• සිය අවසන් රාජ්‍ය සේවා අත්දැකීම් සම්බන්ධයෙන් තෘප්තිමත් ජනගහන ප්‍රමාණය අඩු වීම • තාක්ෂණික ගැටළු වැඩි මට්ටමක පැවතීම • සේවා නියුක්ත ප්‍රමාණයෙන් වැඩි කොටසක් අවුරුදු 55ට වඩා වැඩි වීම
17. ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය	• මාතලේ දිස්ත්‍රික්කය තුළ මූල්‍යමය, තාක්ෂණ, ධාරිතාවන් ගොඩනැංවීම, වෙළඳාම ප්‍රතිපත්ති සහ ආයතනික සංගතභාවය, විවිධ පාර්ශවයන්ගේ හවුල්කාරිත්වයන්, දත්ත අධික්ෂණය හා වගකීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුලින් විධිමත් වැඩසටහන් මාලාවක් දිස්ත්‍රික් ලේකම් මඟින් අධීක්ෂණය සිදු වීම	• උද්දමනය ඉහල අගයක් ගැනීම • වැඩි බදු ප්‍රතිපත්ති • තාක්ෂණික වෙනස්වීම • රටවල් අතර අන්‍යෝන්‍ය සබඳතාවයන් අවම වීම • අපනයන කෘෂිකර්මාන්තය කෙරෙහි යොමු වූ ව්‍යාවසායකයන් ප්‍රමාණය අඩු වීම • දත්තවල ඇති පරස්පරතාවය

06. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩල වාර්තාව - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	තනතුර	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	රා.ප.ව.14 /2022 යටතේ නිවාඩු ලබා ඇති නිලධාරීන් සංඛ්‍යාව	පූරප්පාඩු සංඛ්‍යාව (රා.ප.ව.14/2022 යටතේ නිවාඩු ලබා ඇති නිලධාරීන් හැර)	අතිරික්ත සංඛ්‍යාව (රා.ප.ව.14/2022 යටතේ නිවාඩු ලබා ඇති නිලධාරීන් ද ඇතුළුව)
විධායක	දිස්ත්‍රික් ලේකම් / දිසාපති	1	1	0	0	0
	අතිරේක දිස්ත්‍රික් ලේකම්	2	2	0	0	0
	අධ්‍යක්ෂ (සැලසුම්)	1	1	0	0	0
	ප්‍රධාන ගණකාධිකාරි	1	1	0	0	0
	ප්‍රධාන අභ්‍යන්තර විගණන	1	1	0	0	0
	ප්‍රධාන ඉංජිනේරු	1	1	0	0	0
	සහකාර දිස්ත්‍රික් ලේකම්	1	1	0	0	0
	සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)	4	3	0	1	0
	සහකාර අධ්‍යක්ෂ (Supernumerary)	2	2	0	0	0
	ගණකාධිකාරි	1	1	0	0	0
	එකතුව	**15**	**14**	**0**	**1**	**0**
භාෂා	පරිපාලන නිලධාරි	1	1	0	0	0
	භාෂා පරිවර්තක (සිංහල-ඉංග්‍රිසි)	1	1	0	0	0
	භාෂා පරිවර්තක (සිංහල-දෙමළ)	1	1	0	0	0
	තොරතුරු හා සංනිවේදන තාක්ෂණික නිලධාරි	1	0	0	1	0
	එකතුව	4	3	0	1	0
තාක්ෂණික	සංවර්ධන සම්බන්ධීකාරක	2	2	0	0	0
	සංවර්ධන නිලධාරි	31	76	5	0	45
	කාර්මික නිලධාරි	2	2	0	0	0
	සැලසුම් ශිල්පි	1	0	0	1	0
	රාජ්‍ය කලමනාකරණ සේවා නිලධාරි	30	29	2	1	0
	තොරතුරු හා සංනිවේදන තාක්ෂණික සහකාර	2	2	0	0	0
	කාර්මික සහකාර නිලධාරි	2	1	0	1	0
	එකතුව	**70**	**112**	**7**	**3**	**45**
පාරිභෝගික	රියදුරු	8	7	1	1	0
	විදුලි කාර්මික	1	1	0	0	0
	බංගලා භාරකරු	1	1	0	0	0
	කාර්යාල කාර්ය සහයක	15	15	0	0	0
	කාර්යාල කාර්ය සහයක දෙපාර්තමේන්තුගත	1	0	0	1	0
	එකතුව	**26**	**24**	**1**	**2**	**0**
	සමස්ත එකතුව	**115**	**153**	**8**	**7**	**45**

6.2 මානව සම්පත් අතිරික්තය හෝ පුරප්පාඩු පැවතීම ආයතනික කාර්ය සාධනය කෙරෙහි බලපෑම කෙටියෙන් විස්තර කරන්න

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 යටතේ දේශීය වැටුප් රහිත හා විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාගන්නා නිලධාරීන් සිටින බැවින් එලෙස ඇතිවන පුරප්පාඩු සඳහා නිලධාරීන් යෙදවීම සම්බන්ධයෙන් පැහැදිලි උපදේශනයක් නොමැත. විශේෂයෙන්ම රියදුරු හා කාර්යාල සේවා නිලධාරින් අනුමත කාර්ය මණ්ඩලය තුලම පමණක් සිටින බැවින් එම නිලධාරීන්ගේ නිවාඩු යාම මත ඇතිවන පුරප්පාඩු සඳහා නිලධාරීන් යොමු කිරීමට පැහැදිලි නියෝගයක් අවශ්‍ය වේ.

6.3 සේවක මණ්ඩල ධාරිතා වර්ධනය

අනු අංකය	පුහුණු පාඨමාලාවේ නම	පවත්වන ලද වැඩමුළු ගණන	සහභාගී වූ සංඛ්‍යාව	මුළු වියදම
1.	ක.ස.සේ. I පංතියේ නිලධාරීන් කඩඉම් විභාගයෙන් නිදහස් කිරීමට අදාල පුහුණු වැඩමුළුව	01	41	150250.00
2.	කාර්යාල කළමනාකරණය	01	53	40560.00
3.	මූල්‍ය කළමනාකරණය	01	43	40260.00
4.	ව්‍යාපෘති කළමනාකරණය	01	32	53364.00
5.	තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව	01	66	53100.00
	එකතුව	01	235	337534.00

07. අනුකූලතා වාර්තා

අ.අ.	උපයෝගී අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යකරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	අනුකූල වේ		
02	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			

2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගනෙ යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ	අනුකූල වේ		

	සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පන්තේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමණාකරන කමිටුව**			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැ කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩලය ඉක්මවා ඇත	අමාත්‍යාංශය වෙත දන්වා ඇත

16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට **අනුකූල වේ** වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		

19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදයප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලසුම පිළියෙල කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		